# ශු. අන්තෝනි මුනිඳුන්ගේ සිද්ධස්ථානයේ දිනපතා (Soup Kitchen) හි ලබාදෙන දිවා ආහාරය පිළිබඳව පාඨක අදහස්

*සිටියෙමි මම හාමතේ ඔබ මා කැව්වේ*

දවාලට ලැබෙන මේ කෑම වේල දුප්පත් අපට හරියට වටිනවා. දෙවියන්වහන්සේගේ ආශිර්වාදයක් ලෙස සලකා අපි එතුමන්ට ස්තුතිවන්ත වෙනවා. මේ සඳහා දායක වන සැමට අපි ශු. අන්තෝනි මුනිඳුන්ගේ පිහිට ප්‍රාර්ථනා කරනවා.

- පී. එන්. පද්මාවතී -
මට්ටක්කුලිය

ඇත්තෙන්ම මෙම වැඩ සටහන ආශිර්වාදයක්. සමහර විට අපි ශු. අන්තෝනි මුනිඳුන්ට භාරයක් වෙලා එය සාර්ථකවීම නිසා අපි දානයක් පිරිනමන්න බලාපොරොත්තු වුනත් එය හිරියාකාරව කරන්නේ කොහොමද කියලා අපි දන්නේ නැහැ. නමුත් දේවස්ථානයේ ඒ සඳහා ක්‍රමවේදයක් සලසා දෙමින් අපි ලබාදෙන මුදලින් දුප්පත් මිනිසුන්ට කෑම වේලක් විධිමත්ව සූදානම් කරදීම අගේ කරන අතර අපේ සිතටත් එය සතුටකි.

- ජානක ඩී සිල්වා -
කිරුළපන

බොහෝ විට ගෙදර දවාලට උයාගන්න විදිහක් අපට නැහැ. අපේ දරුවෝ පාසල් ගිහිල්ලා ඇවිල්ලා දවාලට කන්නේ මේ පල්ලියෙන් දෙන කෑම. ඒක අපට ලොකු අස්වැසිල්ලක්. රෑට අපි තියෙන විදිහට යමක් උයාගෙන කනවා.

- මුතුමාලා -
වැල්ලම්පිටිය

මෙසේ දේවස්ථානයෙන් දහවල් කෑම වේල ලබාදීම ඉතාමත් අගේකොට සලකනවා. මෙවැනි පරිසරයක ජනතාවට මෙම කෑමවේල අවශ්‍යතාවයක් බව කිව යුතුයි. නොයෙක්ලෙස රෝග නිසා රෝහල් වල ප්‍රතිකාර ගන්නට ගොස් කාලය ගත කර පැමිණෙන රෝගියෙකුට වුවත් මෙසේ පිරිසිදු කෑම වේලක් ලැබීම භාග්‍යයක් කොට සලකමි. මෙහි වටිනාකම රැකගෙන ස්තුතිපූර්වකව එය ලබාගන්නේ නම් දෙන්නාටත් ලබන්නාටත් පිනක් අත්වෙන බව මගේ හැඟීමයි.

- මංජුලා -
ජම්පටා වීදිය

අවස්ථාවක් ලද වහාම අපි මෙම දේවස්ථානයට පැමිණෙන්නේ අපේ නොයෙක් අවශ්‍යතාවයන් ශු.අන්තෝනි මුනිඳුන්ගෙන් අපට ලැබෙන නිසයි. අපි දුර බැහැර ඉඳලා එන්නේ දිව්‍ය පූජාවටත් ඉඳලමයි. අපි යන්නේ දේවස්ථානයෙන් ලැබෙන මේ දිවා ආහාරය අපට ලැබීම ගැන හුඟක් අපි ස්තුතිවන්ත වෙනවා.

- චලනි දීපානී -
අවිස්සාවේල්ල